# පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල - 2012

------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය වයාවචනය

මෙම වාර්තාවේ 1.2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

කොළඹ නගර සභාවේ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවන සාමාජිකයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දී මියගිය පුද්ගලයින්ගේ දායක මුදල් ගණනය කිරීම හා සංශෝධනය කිරීමට අදාල ගැලපීම් වශයෙන් රු.12,852,672 ක් වර්ෂයේ ආදායමට හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු දායක මුදල් යටතේ දැක්වෙන පළාත් පාලන ආයතනවලින් ලැබිය යුතු ශේෂය, බිල්කිරීමේ ලේඛන අනුව ලැබිය යුතු දායක මුදල් ශේෂයට වඩා රු.187,490,163 ක් වැඩියෙන් දක්වා තිබුණි. එම වෙනස පැහැදිලි කිරීමට අවශ්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කළමනාකාරීත්වය අපොහොසත් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ සමස්ථ විශ්‍රාම වැටුප් වියදම රු. 93,900,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිගණක දත්ත පද්ධතියේ වියදම් වර්ගීකරණයට අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සමස්ථ විශ්‍රාම වැටුප් වියදම රු.837,302,193 ක් වූයෙන් රු.743,402,193 ක වෙනසක් නිරික්ෂණය විය. එම වෙනස පැහැදිලි කිරිමට අවශ්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කිරිමට කළමනාකරණය අපොහොසත් විය.

**1.2.3** <u>පැහැදිළි නොකළ වෙනස්කම්</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු හිඟ දායක මුදල් ශේෂය රු.1,497,506,586 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද උප ලේඛනයේ එම ශේෂය රු.1,496,838,592 ක් ලෙස දක්වා තිබීම නිසා ලැබීය යුතු දායක මුදල් ශේෂයේ රු.667,994 ක වෙනසක් විය.

**1.2.4** <u>අවිනිශ්චිත ගිණුම්</u>

2012 දෙසැම්බර් 31 දිනට දායක මුදල් ගැලපුම් ගිණුමේ රු.269,433 ක නිරවුල් නොවූ ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.2.5** <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

ගිණුම්වල දක්වා තිබුණු රු.604,652 ක් වූ අගරු චෙක්පත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබු අතර එම චෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

මෙම අහරු චෙක්පත් සඳහා වු වටිනාකම 1998 වර්ෂයට පෙර සිට පැවත එන බවත් , මේ පිළිබඳව තොරතුරු තවදුරටත් සොයමින් පවතින බවත් , විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2013 නොවැම්බර් මස මා වෙත වාර්තාකර තිබුණි.

### 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති , රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 20 වගන්තිය හා 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 4:3 ඡේදය | පළාත් පාලන ආයතන විසින් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් වශයෙන් රු. 1,496,838,592 ක් වූ හිඟ ශේෂය පළාත් පාලන සේවා පනතේ 20 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනවලට ගෙවීමට ඇති යම් මුදලකින් අඩුකර ගැනීමට හෝ චක්‍රලේඛ උපදෙස් පරිදි ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක ජීඑෆ් /423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 4.1(අ) ජේදය | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.25,963,371 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.54,478,480 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයේ රු.28,515,109 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු ආයතන දායක මුදල රු.119,863,371 ක් වූවත් ලැබී තිබුණේ රු.93,630,499 ක් පමණි. විශ්‍රාම වැටුප් ගෙවීම වෙනුවෙන් විශ්‍රාම වැටුප්

දෙපාර්තමේන්තුව වෙත අරමුදලින් රු.93,900,000 ක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කළ දායක මුදලින් නොලැබුණු රු.26,232,872 ක මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් ගෙවා තිබුණි. එසේ ගෙවන ලද මුදල පිළිබඳ කිසිදු සටහනක් අරමුදලේ ගිණුම් ප්‍රකාශනවල ඇතුළත් වී නොමැති බව නිරීක්ෂණය විය.

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කාර්ය සාධනය</u>

මරණයට පත්වූ විශ්‍රාමිකයින්ගේ නම් බිල් ලේඛණවලින් ඉවත් නොකර දිගින් දිගටම පළාත් පාලන ආයතනවලට අදාල බිල්පත් සකස් කිරීම නිසා ඉදිරිපත් කරනු ලබන බිල්පත්වල වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. 2011 හා 2012 වර්ෂ සඳහා දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශයෙන් ලබාගත් දත්තයන් අනුව ඉවත් වූ විශ්‍රාමිකයින් සංඛ්‍යාව 1651 ක් වුවත් ඔවුන්ගේ නම් බිල් ලේඛනවලින් ඉවත්කර නොමැති බව නිරික්ෂණය විය.

### 3.2 <u>දායක මුදල් කළමනාකරණය</u>

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනයට අනුව පලාත් පාලන ආයතන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු හිඟ ආයතන දායක මුදල රු.1,496,838,592 ක් වූ අතර එයින් සියයට 55.43 ක් මහනගර සභාවලින්ද සියයට 15.13 ක් නගර සභාවලින්ද සියයට 29.44 ක් ප්‍රාදේශිය සභාවලින්ද අයවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී දායක මුදල් කිසිවක් ගෙවා නොමැති ප්‍රාදේශිය සභා සංඛ්‍යාව 242 වූ අතර එම ආයතනයන්ගෙන් ලැබිය යුතු දායක මුදල රු.12,677,995 ක් විය.

**3.3** පසුගිය වර්ෂ කිහිපයක පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් හා එම වර්ෂවලට අදාල දායක මුදල් ගිණුම්ගත කිරීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | විශ්‍රාම වැටුප් ගෙවීම | වර්ෂයට අදාල දායක මුදල |
|---|---|---|
| | රු. | රු. |
| 2009 | 944,733,709 | 136,674,797 |
| 2010 | 940,060,460 | 129,981,285 |
| 2011 | 689,425,595 | 122,978,480 |
| 2012 | 837,302,193 | 119,863,371 |

මෙ

සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයට වඩා 2010 වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම රු.250,634,865 කින් වැඩි වී තිබුණු අතර 2012 වර්ෂයේදී 2011 වර්ෂයට වඩා රු.147,876,598 කින් වැඩි වී තිබුණත් වර්ෂයට අදාල දායක මුදල ක්‍රමයෙන් වාර්ෂිකව අඩුවී තිබුණි. මෙසේ දායක මුදල් අඩුවීමටත්, විශ්‍රාම වැටුප ගෙවීම වැඩිවීමටත් තුඩුදුන් හේතුන් පිළිබඳ කිසිදු පිළිගත හැකි තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සංඛ්‍යාලේඛන අංශයෙන් ලබාගත් දත්ත අනුව 2012 වර්ෂයේදී විශ්‍රාමිකයන් 1651 දෙනෙක් ඉවත්වීම සිදු වී තිබුණත් විශ්‍රාම වැටුප් වියදම රු.147,876,598 කින් වැඩි වී තිබුණි.

(ඇ) පසුගිය වර්ෂ කිහිපය තුළ අවස්ථා කීපයකදීම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කර තිබුණත් ඒ අනුව අදාල දායක මුදල් සංශෝධනය කිරීමක් සිදු කර නොතිබුණි.

## 4. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) හිඟ දායක මුදල්